جمعية علماء سريلنكا

සමස්ථ ලංකා ජම්ඉයියතුල් උලමා

அகில இலங்கை ஜம்இய்யத்துல் உலமா

ALL CEYLON JAMIYYATHUL ULAMA

# හලාල් සහතිකය සඳහා ගාස්තු අය කිරීමක් ඇයි?

## හලාල් සහතිකය සඳහා ගාස්තු අය කිරීමක් ඇයි?

සේවයක් ලබා ගැනීම සඳහා ගාස්තුවක් ගෙවීම අවශ්‍ය බව අප සැම දන්නෙමු. මෙම ගාස්තුව අය කරන්නේ එම සේවාව ලබා දෙන ආයතනයට හෝ සංවිධානයට ඇති සේවක මණ්ඩල වැටුප් ඇතුළු අනේක වියදම් හා පිරිවැය පියවා ගැනීම සඳහාය.

ප්‍රමිතියක් සඳහා සහතික ලබා දෙන සැම ආයතනයකට මෙන්ම හලාල් සහතිකය නිකුත් කරන අප ආයතනයටද කළමනාකරණ වියදම් බොහෝ ඇති බව වෙසෙසින් කිව යුතු නැත. භාණ්ඩ සඳහා ප්‍රමිති සහතිකය, නිෂ්පාදන පද්ධතිය සඳහා වන සහතිකය, අවදානම් කළමනාකරය සඳහා වන සහතිකය යනාදිය නිකුත් කරන විට යටිතල පහසුකම්, සන්නිවේදනය, ගමනාගමනය, මානව සම්පත්, විශේෂඥ හා උපදේශන ගාස්තු යනාදි ලෙසින් මෙම ක්‍රියාවලියට අදාල වියදම් රාශියක් ඇත.

හලාල් අංශයේ මව් සංවිධානය වන සමස්ත ලංකා මුස්ලිම් ආගමික වියතුන්ගේ සංගමයට කොළඹ ප්‍රධාන කාර්යාලයක් ඇති අතර එහි අදාල විද්වතුන් කණ්ඩායමක් මෙන්ම පරිපාලකයන්, ආහාර තාක්ෂණවේදීන් (food technologyist), ගිණුම්කරුවන්, ආදීන් සේවයේ යෙදී සිටිති. එමෙන්ම හලාල් සහතික ලත් කර්මාන්තශාලා හා පැසිරුම් මධ්‍යස්ථානවල නිෂ්පාදන ක්‍රියාදාමයන් හලාල් නිර්දේශවලට අනුකූලව සිදු කරනු ලබන්නේදැයි අධීක්ෂණය කරන්නන්ද විශාල සංඛ්‍යාවක් අප විසින් පත් කර ඇත. එසමගම එම ක්‍රියාදාමය නිරීක්ෂණය කිරීම සඳහා වසර පුරා දිවයිනේ නන් දෙසට කිලෝමීටර දහස් ගණනක් සංචාරය කරන නිරීක්ෂකයන්ද සිටිති. එමෙන්ම අපගේ ප්‍රකාශන හා මාධ්‍ය කටයුතු මෙන්ම විමසීම් සඳහා පැහැදිලි කිරීම් ලබා දීම සඳහා වන පාරිභෝගික සහය සේවාවක්ද නිරන්තරයෙන්ම පවතියි. මේ සැම දෙයක් සඳහා වන වියදම්ද බොහෝ ඇත.

මෙම අය කිරීම් ඉහත සඳහන් වියදම් පියවීමට මිස දේශීය හෝ විදේශීය වෙනත් අරමුණු සඳහා උපයෝගී නොවන බව ඉතාමත් පැහැදිලි කරුණකි. කෙසේ වෙතත් අපගේ සියලුම ගිණුම් පිළිගත් විගණකාධිවරුන් විසින් විගණනයට ලක් කර ඒ සම්බන්ධ වාර්ෂික වාර්ථා පවත්වාගෙන යන අතර යම් අයෙකුට මේ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම්, ඒ පිළිබඳව සාකච්චා කිරීමට අප සූදානම්ව සිටින්නෙමු.

මේ සියලුම වියදම් අතර වුවද ලාභ අරමුණු නොමැති සංවිධානයක් ලෙසින් හා අප කරමින් සිටින පොදු ජන මෙහෙවරේ වැදගත්කම මනාව වටහා ඇති සංවිධානයක් හැටියට, අපගෙන් හලාල් සහතික ලබා ගන්නා කර්මාන්තශාලා හා සමාගම්වලට ඇති විය හැකි මුල්‍යමය අසීරුතාවයන් හැකි පමණ අවම කරමින් ඒ අනුව හලාල් සහතිකය වෙනුවෙන් වන ගාස්තු ව්‍යුහය ඉතා දැරිය හැකි මට්ටමකින් පවත්වාගෙන යන්නෙමු.

## ව්‍යාපාරික සමාගම්වලින් අප ගාස්තු අය කරන්නේ කෙසේද?

ගාස්තු අය ක්‍රමය සම්පාදනය කරන විට සමාගම් මෙන්ම පාරිභොගිකයන් ගැන අප ඉතාමත් සැලකිලිමත් වන්නෙමු. දැනට පවතින අපගේ අය ක්‍රමය සකසා ඇත්තේ බහුජාතික දැවැන්ත සමාගම්වලට පමණක් නොව, කුඩා කර්මාන්තශාලා හිමි මධ්‍යම හා සුළු ප්‍රමාණයේ සමාගම්වලට මෙන්ම ඒ අනුව පාරිභෝගිකයන්ටද හෝ කිසිදු බරක් නොදැනෙන පරිදිය. පහත දක්වා ඇති වගුවෙහි අපගේ අය ක්‍රමය හා ඒ අනුව නිමි භාණ්ඩයට එයින් ඇති වන බලපෑම කෙතරම් ක්ෂුද්‍ර දැයි කෙනෙකුට වටහා ගත හැකිය.

| භාණ්ඩ | එක් භාණ්ඩයකට මාසික ගාස්තුව : රුපියල් | | |
|---|---|---|---|
| | කුඩා කර්මාන්ත | මධ්‍ය පරිමාණ කර්මාන්ත | මහා පරිමාණ හා බහු ජාතික කර්මාන්ත |
| 1 to 5 | 500-700 | 1000-1250 | 1500-2000 |
| 6 to 10 | 400-600 | 800-1000 | 1250-1500 |
| 11 to 20 | 250-400 | 600-800 | 800-1000 |
| 21 to 30 | -NA- | 400-600 | 600-800 |
| 31 to 50 | -NA- | 200-300 | 350-500 |
| 51 to 100 | -NA- | 100-200 | 200-300 |
| >100 | -NA- | -NA- | 20,000-25,000** |

** භාණ්ඩ ගණන 100කට වඩා වැඩි නම් ගාස්තුව මුළු ආයතනයටම රු 20000-25000 ස්ථිරව පවති.

ඉහත සඳහන් අයකිරීමේ සටහනට අනුව මිස අන් කවර ක්‍රමයකින්වත් ගාස්තුවක් අය නොකෙරෙන බව අප ස්ථිර කරන්නෙමු. හලාල් නිෂ්පාදන 4000ක් සඳහා වාර්ෂිකව එක් නිෂ්පාදනයකට රු. 175,000 ක් අය කරනු ලැබෙන බව හෝ සමාගමක අවසන් ලාභාංශයෙන් යම් ප්‍රතිශතයක් අය කරනු ලබන බවට නගා ඇති චෝදනා කිසිම පදනමක් රහිත වන බව ස්ථිරවම තහවුරු කරන්නෙමු.

යමෙකුට මේ පිළිබඳව සමස්ථ ලංකා මුස්ලිම් වියතුන්ගේ සංගමය වන අපෙන් පමණක් නොව අප ආයතනයෙන් සහතික ලත් ඕනෑම සමාගමකින් ද විමසා බැලිය හැක.

| කුඩා පරිමාණ | භාණ්ඩ ගණන | එක් භාණ්ඩයකට මාසික ගාස්තුව | මාසික මුලු අය කිරීම | වාර්ශික මුලූ අය කිරීම |
|---|---|---|---|---|
| 1 ABC ලංකා | 1 | 500 | 500.00 | 6,000.00 |
| 2 ABC මී කිරි නිෂ්පාදක | 4 | 500 | 2,000.00 | 24,000.00 |
| 3 ABC තේ අපනයන කරු | 12 | 250 | 3,000.00 | 36,000.00 |
| මධ්‍ය පරිමාණ | | | | |
| 4 ABC කිරි නිෂ්පාදක | 5 | 1000 | 5,000.00 | 60,000.00 |
| 5 ABC බිස්කට් නිෂ්පාදක | 25 | 400 | 10,000.00 | 120,000.00 |
| මහා පරිමාණ | | | | |
| 6 ABC රස කැවිලි නිෂ්පාදක | 75 | 200 | 15,000.00 | 180,000.00 |
| 7 ABC බහු ජාතික සමාගම | 101 | N/A | 25,000.00 | 300,000.00 |

## හලාල් සහතිකය සමාගම්වලට බරක්ද?

ඉහත දක්වා ඇති නිදසුන් හත දෙස බලන ඕනෑම කෙනෙකුට ඒ සෑම අවස්ථාවකම භාණ්ඩයේ මිලෙහි හලාල් සහතිකයේ ගාස්තුව නියෝජනය වන ප්‍රමාණය කිසිසේත් පාරිභෝගිකයාට නොදැනෙන බව පැහැදිලිවම වැටහී යයි. එමෙන්ම තමන්ගේ නිෂ්පාදන ධාරිතාවය කිසිදු සමාගමක් තත්ත්වාකාරව හෙළි නොකරන හෙයින් ඉහත නිෂ්පාදනවල සංඛ්‍යාවන් නියත වශයෙන්ම තවත් වැඩි වන අතර එවිට හලාල් සහතිකය සඳහා වන ගාස්තුව ඉහත ප්‍රකාශිත අගයන්ටත් වඩා තවත් අඩු වන බව පැහැදිළි කරුණකි.

මෙම සරල පැහැදිලි කිරීම අනුව හලාල් සහතිකය ලබා ගන්නාට හෝ අවසන් පාරිභෝගිකයාට එයින් ඇති වන වෙනස නොදැනෙන හා නොහැඟෙන තරම්ය.

වත්මන් ව්‍යාපාර ලෝකයේ තරඟකාරී වාතාවරණයෙහි විජයග්‍රාහීව රැඳී සිටිමින් වැජඹෙන්නට වෙළඳපළ හා පාරිභෝගිකයා ඉල්ලා සිටින සියලුම ප්‍රමිතීන් හා ගුණාත්මභාවයන් ලබා දීමට සමාගම් නිරන්තයෙන්ම සූදානම්ව සිටිති. වෙළඳ ප්‍රචාර, විශේෂ දීමනා, වට්ටම්, තරඟ හා තෑගි ප්‍රදානයන්, පාරිභෝගික විදෙස් සවාරි වැනි දේ සඳහා ඔවුන් විශාල වශයෙන් මුදල් වැය කරන්නේ මේ හේතුව නිසාය. එමෙන්ම **ISO, SLS, HACCP** වැනි තත්ත්ව සහතික ඔවුන් ලබා ගන්නේද ඒවාට ඇති අභිමානය නිසා නොව සිය අලෙවිය හා ලාභය වැඩි කරමින් ක්ෂේත්‍රයේ කාර්යක්ෂමව සදාකල් රැඳී සිටීමට ඒවාට දායක වීම අනිවාර්ය යැයි ඔවුන්ට පෙනී ගිය හෙයිනි.

කෙටියෙන් කිවහොත් ව්‍යාපාරික සමාගම් කිසිදු ක්‍රියාවක් ලාභ අරමුණු නොමැතිව නොකරති. වත්මන් හලාල් සහතිකය ලබා ගැනීමටද ඔවුන් වැඩිවැඩියෙන් උනන්දු වන්නේ එයින් ඔවුන්ගේ අලෙවිය හා ලාභය වැඩි වන බව වටහා සිටින හෙයිනි.

## හලාල් සහතිකය ලබා ගැනීම නිසා සමාගම්වලට අත්වන වාසි ඇතැමක් පහත විස්තර කර ඇත:

හලාල් ආහාර පාන හා අනෙකුත් භාණ්ඩ වලට විදෙස් රටවල වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරා, සිය අපනයන අලෙවිය වැඩි කර ගත හැකි වීම. (ලොව හලාල් වෙළෙඳාම වසරකට ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 2.6 ක් උපයන අති දැවැන්ත වෙළඳපළක් බවට පත්ව ඇති බව ජගත් හලාල් සම්මේළනය ගණන් බලා ඇත)

හලාල් ආහාර පාන ඉල්ලා සිටින දේශීය පාරිභෝගිකයන්ට පමණක් නොව මෙහි එන විදෙස් සංචාරකයන් අතර හලාල් ඉල්ලා සිටින්නන්ටද තම නිෂ්පාදන අලෙවි කළ හැකි වීම.

ශත ගණනක් පමණක් වැය කිරීමෙන් ලොව පිළිගත් ප්‍රමිතියක් තම භාණ්ඩවලට එක් කර ගැනීමට හැකි වීම.
අප මෙතෙක් ඉදිරිපත් කළ කරුණු අනුව සුළු මුදලක් වැය කර වෙළඳ සමාගම් ලබා ගන්නා හලාල් සහතිකයෙන් ලැබෙන වාසි දේශ සීමා පසුකර යන්නක් බව හා එය අති දැවැන්ත වාසි ලබා දෙන නැණවත් පියවරක් බව කාටත් වැටහෙනු ඇත. හලාල් සහතිකයෙන් සිදු වන්නේ සමාගමක අලෙවි පරාසය තවත් පුළුල් වීම හා සමාගම තව තවත් දියුණුව හා ලාභය ලැබීම මිසල ඔවුන්ට එයින් කිසිදු පාඩුවක් ඇති කෙරෙන්නේ නැත.

## හලාල් සහතිකය පාරිභෝගිකයාට බරක්ද?

සමාගමකට බරක් නොවන දෙයක් පාරිභෝකියාට බරක් විය නොහැකි බව පුන පුනා කිව යුතු නොවේ.

වැඩි වෙමින් පවතින ජීවන වියදම නිසා තත්ත්ව සහතිකයකට හෝ කිසිදු දෙයකට වැඩිපුර මුදලක් නිකරුණේ වැය කිරීමට අද පාරිභෝගිකයා කොහෙත්ම කැමති නැත. සමාගම්ද සිතනුයේ මෙම දෘශ්ඨිකෝනයෙන්මය. එනම් අනවශ්‍ය යැයි ඔවුන් සිතන සහතිකයකට ඔවුන් මුදල් වැය කරන්නට කිසිසේත් ඉදිරිපත් වන්නේ නැත. පාරිභෝගිකයාට බරක් වනු ඇත යැයි හෝ සිය තරඟකාරීත්වයට හානියක් වනු ඇත යැයි සමාගමක් සිතන වැයක් ඔවුන් අන් ස්වරූපයකින් යටපත් කරගනු මිස එය පාරිභෝගිකයාට නොයවන්නට වග බලා ගනිති.

## හලාල් සහතිකය සඳහා අය කරන මුදල් ත්‍රස්ත සංවිධානවලට ලබා දෙනවාද?

හලාල් සහතිකය ලබා ගැනීමට සමස්ථ ලංකා ජම්යියතුල් උලමා අය කරන මුදල් ජගත් ත්‍රස්ථ අරමුදලට ලබා දෙන බවට නගා ඇති චෝද්නාව ඔප්පු කරන් ලෙස අභියෝග කරන්නෙමු. මිනිසුන් උද්වේගයට පත්කිරීම සඳහා මෙවන් මුසාවාද ඉදිරිපත් නොකරන ලෙස ඉල්ලා සිටින්නෙමු.

හලාල් (අනුමත) සංකල්පය පිළිබඳව මෙවන් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමෙන් හෙළිදරවු කර ඇත්තේ මෙම විශය පිළිබඳව නොදැනුවත් බව මිස අන් කිසිවක් නොවේ. හලාල් හෝ අනෙකුත් ඉස්ලාමීය ප්‍රශ්ණයන් පිළිබඳව දැනගැනීමට අවශ්‍ය නම් කරුණාකර අප සමග සම්බන්ධ වී කරුනු පැහැදිළි කර ගැනීම සුදුසු යැයි සිතන්නෙමු.

හලාල් සහතිකය ලබා ගැනීම සඳහා අය කරන් ප්‍රමාණයන් පිළිබඳ විස්තර පහතින් ලබා දී ඇත්තෙමු. අපගේ ගිණුම් රජයේ නීති රීති වලට අනුකූලව නිවැරදිව පවත්වාගෙන යන අතර ඒවා වාර්ෂිකව විගණනය කොට සහතික කර ඇත. මේ කිසිවක් රහස් ලෙඛණ නොවන අතර මෙය පරීක්ෂා කර බැලීම සඳහා අප කාර්යාලය වෙත ක්‍රමාණුකූලව පැමිණ එම කරුණ ඉටු කර ගත හැකි බව ප්‍රකාශ කරන්නෙමු.

වත්මන් ව්‍යාපාර ලෝකයේ උක්ත කරුණු ගැන සමාගම් ඉතාමත් සැලකිලිමත් වන අතර, භාණ්ඩයක අවසන් මිල තීරණය වන්නේ අමුද්‍රව්‍ය, ශ්‍රමය, රජයේ බදු, ආයතනික පිරිවැය, වෙළඳපළ ප්‍රවණතාවයන් යනාදී කරුණු සැලකිල්ලට ගනිමිනි. සාමගම් කවදත් මිල පිළිබඳ හෝ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වන සහතිකයක් බාහිර ආයතනයකින් ලබා ගන්නේ නම් එය කළ යුතුමද යන කරුණු තීරණය කරන්නේ ඉතාමත් බැරෑරුම් ලෙසින් එම කරුණුවලට අදාලා සාධක විධායක හා අධ්‍යක්ෂ මට්ටමින් තීව්‍රව සලකා බලා හා තර්ක විතර්ක සසඳා බැලීමෙන් පසුවය. තවද එයින් පමණක් සෑහීමට පත් නොවීල මේ සඳහා අවසාන නිගමනයකට ඔවුන් එළඹෙන්නේ විශාල ප්‍රමාණයේ මුදල් හා සම්පත් වැය කරමින් වෙළඳපළ සමීක්ෂණද පවත්වා එහි ප්‍රතිඵල සමාලෝචනය කිරීමෙන්ද පසුවය.